www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකාව: ජාත්‍යන්තර මූල්‍ය අරමුදල දරුනු කප්පාදු පිලිවෙත් අවධාරනය කරයි

## Sri Lanka: IMF insists on severe austerity measures

**නන්ද වික්‍රමසිංහ විසිනි**

**2010 මැයි 24**

දින 10ක විමර්ශන චාරිකාවකින් පසුව, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ශ්‍රී ලංකාව පිලිබඳ දූත කන්ඩායම, අයවැය හිඟය කප්පාදු කිරීමට ආන්ඩුව සැලසුම් කර ඇති පියවර මගින් තමන් "ධෛර්‍යමත්" වූ බව පසුගිය බ්‍රහස්පතින්දා නිවේදනය කලේය. කෙසේවෙතත්, දැන් ජූනි 29දාට සැලසුම් කර ඇති බොහෝ සෙයින් පමා වූ 2010 අයවැය යෝජනා මගින් ආන්ඩුව තවදුර වියදම් කප්පාදු ක්‍රියාවට දමන තෙක් මූල්‍ය අරමුදල සිය එ.ජ. ඩොලර් බිලියන 2.6 නය මුදලේ තෙවන වාරිකය තවදුරටත් අත්හිටුවනු ඇත.

මූල්‍ය අරමුදල හෝ ආන්ඩුව හෝ දොරගුලු ලාගෙන පැවති සිය සාකච්ඡාවල අන්තර්ගතය හෝ සැලසුම් කර ඇති කප්පාදු ගැන කිසිදු විස්තරයක් හෝ එලිදරව් කර නැත. එහෙත් එම කප්පාදු පිලිවෙත්, රජයේ වියදම් කපා දැමීම, රාජ්‍ය දේපොල විකිනීම හා බදු වැඩි කිරීම මගින් ගෝලීය මූල්‍ය අර්බුදයේ බර වැඩ කරන ජනතාව මත පැටවීමට ග්‍රීක ආන්ඩුව සහ ලොව වටා නය බරින් මැඩුනු සෙසු ආන්ඩු ක්‍රියාවට දමන පිලිවෙත්වලට සමාන වනු ඇත.

2009 වසරේ අයවැය හිඟය දල දේශීය නිෂ්පාදිතයෙන් (දදේනි) සියයට 7ක් විය යුතු බවට තමන් පැන වූ ඉලක්කය සැපිරීමට ආන්ඩුව අපොහොසත් වූ බැවින්, පෙබරවාරියේ දී, මූල්‍ය අරමුදල පසුගිය ජුලි මස අනුමත කල ඇප දී ගලවා ගැනීමේ නය මුදලේ තෙවන වාරිකය අත්හිටුවීය. පසුගිය වසරේ හිඟය සියයට 9.7 දක්වා නැඟුනි. එයට මූලික හේතුව වූයේ දෙමල ඊලම් විමුක්ති කොටි (එල්ටීටීඊ) සංවිධානයට එරෙහි සිවිල් යුද්ධය වෙනුවෙන් කල දැවැන්ත මිලිටරි වියදම් ය. 2008 වසරේ දී දල දේශීය නිෂ්පාදිතයෙන් සියයට 81ක් වූ රාජ්‍ය නය පසුගිය වසරේ දී සියයට 86 දක්වා පිම්මේ ඉහල නැංගේය.

මූල්‍ය අරමුදලේ නය කොන්දේසිවලට අනුව, බදු දැල පුලුල් කිරීම සහ "පාඩු ලබන" රාජ්‍ය සංස්ථා ප්‍රතිව්‍යුහගත කිරීම ඇතුලුව, අයවැය හිඟය 2010 වසරේ දී සියයට 6 දක්වා ද 2011 දී සියයට 5 දක්වා ද කප්පාදු කිරීමට ආන්ඩුව පොරොන්දු වී තිබේ. 2010 වසර සඳහා අයවැය හිඟයේ ඉලක්කය සියයට 7.5ට සකසනු පිනිස මූල්‍ය අරමුදලේ නය මුදල පිලිබඳව එය සමග යලි සාකච්ඡා කිරීමට ආන්ඩුවට අවශ්‍ය යයි, මූල්‍ය අරමුදලේ මෑතම සංචාරයට පෙරාතුව, භාන්ඩාගාර ලේකම් පී.බී. ජයසුන්දර කියා සිටියේය. කෙසේවෙතත්, මූල්‍ය අරමුදලේ කන්ඩායම අවධාරනය කලේ සිය ඉලක්ක නොවෙනස්ව පවතින බවයි.

"මූලික වශයෙන් වර්තන වියදම් අඩු කිරීම තුලින් වන ඉතිරි කිරීම් හරහා තිරසාර මට්ටමකින් සමස්ත අයවැය පරතරය අඩු කිරීම අන්තර්ගතය" වන 2010 සඳහා වන අයවැය යෝජනාවක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට ආන්ඩුව ක්‍රියා කරනු ඇතැයි බලාපොරොත්තු වන බව ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ නිවේදනයක් සඳහන් කලේය. "පුලුල් බදු ප්‍රතිසංස්කරන ඇති කිරීම සඳහා" ද "ආයෝජන සඳහා වන පරිසරය වැඩි දියුනු කිරීම සඳහා" ද ආන්ඩුව සැලසුම් කර ඇතැයි ද මූල්‍ය අරමුදල පැවසීය.

වියදම් කප්පාදුවේ බර නොවැලැක්විය හැකි ලෙස ම සමාජ වියදම් මත බොහෝ සෙයින් පැටවෙනු ඇත. පසුගිය වසරේ දී, නය පොලී ගෙවීම් අයවැය වියදම්වලින් සියයට 35ක් ද ආරක්ෂක වියදම් එයින් සියයට 21ක් ද විය. මෙම අංශවලින් එකක් වත් කප්පාදු නොකෙරෙනු ඇත. ආන්ඩුවට සිය නය පොලී බිල අඩු කල නොහැකි අතර පසුගිය වසරේ මැයි මස එල්ටීටීඊය පරාජය කෙරුනා වුවත් ආරක්ෂක වියදම් අඩු නොකරනු ඇත. කප්පාදු වැඩපිලවෙලට එරෙහිව නොවැලැක්විය හැකි ලෙසම පැන නගිනු ඇති අරගලවල දී කම්කරු පන්තියට එරෙහිව යොදා ගනු පිනිස මිලිටරිය නඩත්තු කෙරෙයි.

ආචාර්ය බ්‍රයන් එයිට්කන්ගේ නායකත්වයෙන් යුක්ත ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ කන්ඩායම අවධාරනය කල පරිදි, අයවැය හිඟය කප්පාදුවේ ප්‍රධාන අංශ දෙක වන්නේ බදු ආදායම් ඉහල දැමීම සහ වර්තන වියදම් පාලනය කිරීමයි. මූල්‍ය අරමුදලේ නියෝජිතයෝ, වැටුප්වලින් නව බදු අය කිරීම ඇතුලු යෝජනා විමර්ශනය කරනු පිනිස පසුගිය වසරේ දි රාජපක්ෂ පත් කල බදුකරනය පිලිබඳ ජනාධිපති කොමිෂන් සභාව සමග ද සාකච්ඡා කලේය. මේ මස මුල දී ගෑස්

මිල සියයට 14කින් පමන ද පසුගිය සතියේ දී පිටි මිල සියයට 3කින් ද ඉහල දැමීම මගින්, ආන්ඩුව දැනටමත් බදු වැඩි කර තිබේ.

වර්තන වියදම් කප්පාදු කරනු පිනිස, ආන්ඩුව ලංකා විදුලිබල මන්ඩලය, ඛනිජ තෙල් නීතිගත සංස්ථාව, මධ්‍යම ගමනාගමන මන්ඩලය, දුම්රිය හා තැපැල් සේවාව වැනි රාජ්‍ය සංස්ථා ඉලක්ක කරගනු ඇත. ඒවායේ සංයුක්ත පාඩුව රුපියල් බිලියන 49 (එ.ජ. ඩොලර් මිලියන 431) මට්ටමට ලඟා වී ඇත. මූල්‍ය අරමුදල නිර්දේශ කර ඇති සීමාවන් අනුව යමින්, ශ්‍රී ලංකාවේ මහ බැංකුව මෙම ආයතන ප්‍රතිව්‍යුහගත කරන ලෙස ආන්ඩුවට උපදෙස් දී තිබේ. සහනාධාර කප්පාදුව කම්කරුවන්ගේ රැකියා, වැටුප් හා සේවා කොන්දේසි මෙන්ම මිල මත ද බලපානු ඇත.

සෙසු වර්තන වියදම්වලට ආන්ඩුවේ වැටුප් හා විශ්‍රාම වැටුප්, ගොවි සහනාධාර සහ දුප්පතුන් සඳහා ක්‍රියාත්මක වන සොච්චම් සුබසාධන ව්‍යාපෘති ඇතුලත් ය. රාජ්‍ය හා පුද්ගලික අංශයේ මාසික වැටුප් රුපියල් 2,500කින් ඉහල දමන බවට මේ වසරේ ජනාධිපතිවරනයේ දී සහ මහ මැතිවරනයේ දී දුන් සිය පොරොන්දු පාලක ශ්‍රී ලංකා නිදහස් පක්ෂය දැනටමත් ඉවත දමා ඇත.

සමාජ අතෘප්තිය පුපුරායාම ගැන බියෙන්, ජනාධිපති රාජපක්ෂ කප්පාදු පිලිවෙත් ක්‍රියාවට දැමීම මංමුලා සහගත ලෙස කල් දමා තිබේ. පසුගිය නොවැම්බරයේ දී, ඔහු, ජනාධිපතිවරනය හා පාර්ලිමේන්තු මැතිවරනය මේ වසරේ පැවැත්වීමට නියමිතව තිබේ යන්න හේතුවක් ලෙස යොදාගනිමින්, එම මසට නියමිතව තිබූ වාර්ෂික අයවැය කල්දැමීය. එය වනාහි මූල්‍ය අරමුදල ඉල්ලා සිටින දරුනු ප්‍රහාර ගැන එලිදරව් වීමට පෙර මැතිවරනයෙන් යලි බලයට පත් වීමට කල විනිවිද පෙනෙන උපාමාරුවකි. ජනවාරි සිට අප්‍රේල් අග දක්වා වූ මාස තුන ආවරනය කරගනු පිනිස ඔහු "අතුරු සම්මත ගිනුමක් " ඉදිරිපත් කල අතර එහි කිසිදු අයවැය යෝජනාවක් ඇතුලත් නොවුනි.

පාර්ලිමේන්තු මැතිවරනය පසුගිය මස පැවැත්වූ නමුත් නව ආන්ඩුව තවමත් 2010 වසරේ අයවැය ඉදිරිපත් කර නැත. මැයි මස මුල් සතියේ දී, මුදල් ඇමති තනතුර ද දරන රාජපක්ෂ, මැයි සිට ජූලි දක්වා ආන්ඩුවේ එදිනෙදා වියදම් ආවරනය කරගනු පිනිස රුපියල් බිලියන 440ක් වෙන් කිරීමට ජනාධිපති ආඥාවක් නිකුත් කරමින්, පෙර නොවූ විරූ පියවරක් අනුගමනය කලේය. ආන්ඩුව සහ මහ බැංකුව, පාර්ලිමේන්තුව විසුරුවා හැර ඇති අවස්ථාවක මාස තුනක කාලයක් සඳහා මුදල් වියදම් කිරීමේ බලතල ජනාධිපතිට ලබා දෙන ව්‍යවස්ථා වගන්තියක් උපුටා දැක්වීය.

ජනාධිපතිගේ ආඥාව ඔහුගේ අත ආඥාදායක බලතල තව දුරටත් සංකේන්ද්‍රනය වීම සලකුනු කරයි. දිගු කාලීනව පැවත එන පාර්ලිමේන්තු සම්ප්‍රදායන්ට අනුව, රාජ්‍ය අරමුදල්වලින් කරන වියදම් පාලනය කිරීමේ අත්‍යවශ්‍ය බලතල දරන ආයතනය ලෙස සැලකෙන, පාර්ලිමේන්තුව තුල ඒ පිලිබඳ විවාදයක් රාජපක්ෂ තර්‍ය ලෙස වලක්වා ඇත.

ආන්ඩුව තව දුරටත් මූල්‍ය අරමුදලේ නය ලබා ගත යුතු ද නැද්ද යන්න පිලිබඳව පාලක කව තුල යම් විවාදයක් පැවතී ඇත. බොහෝ සෙයින් මහජන විරෝධයට ලක්වන තීන්දුවලට තුඩු දෙන මූල්‍ය අරමුදලේ ඉලක්කවලට බැඳී නොසිටීමට පැහැදිලිවම රාජපක්ෂ වඩා කැමති වනු ඇත. කෙසේවෙතත්, මේ මස මුල දී කල කතාවක දී, මහ බැංකුවේ අධිපති අජිත් නිවාඩ් කබ්රාල් පැහැදිලි කලේ, ශ්‍රී ලංකාවට වෙනත් විකල්පයක් නැති බවයි. "ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ වැඩපිලිවෙල සමග දිගටම කටයුතු කිරීමට අපි කැමැත්තෙමු. ඒ මක් නිසා ද කියතොත්, වත්මන් කාලයේ දී එය අපට වැදගත් රැකුලත් වන හෙයිනි " යයි කබ්රාල් පැවසීය.

ඩොලර් බිලියන 5.2ක් වන වත්මන් විදේශ විනිමය සංචිතය ආරක්ෂක බෆරයක් ලෙස පවතින බවට ආන්ඩුව අවධාරනය කරන නමුදු, යටින් වැඩෙන මූල්‍ය අර්බුදය පිලිබඳව ව්‍යාපාරික ප්‍රභූව උත්සුකව සිටී. මැයි 16 දා පල වූ අදහස් දැක්වීමක දී *සන්ඩේ ටයිම්ස්* පත්‍රය මෙසේ ප්‍රකාශ කලේයː "පසුගිය වසරේ දී දදේනි මෙන් සියයට 10කට ආසන්න මට්ටමක විශාල අගයකට ලඟා වූ දැවැන්ත මූල්‍ය හිඟයක් රටේ ආර්ථික වර්ධනයට හානිකර බවට මොනම ආකාරයක් වත් මතභේදයක් තිබිය නොහැකිය." රාජ්‍ය සංස්ථාවලට "සහනාධාර සැපයීම" අවසන් කරන ලෙස එම පුවත්පත ඉල්ලා සිටියේය.

රටේ වෙලඳ හිඟය මේ වසරේ මුල් මාස දෙක ඇතුලත ඩොලර් බිලියන 1 දක්වා වැඩුනු බවට *සන්ඩේ ටයිම්ස්* ඊයේ වාර්තා කල අතර වෙලඳ හිඟය ඩොලර් බිලියන 6ක් දක්වා ඉහල යනු ඇතැයි ද අනාවැකි පල කලේය. පසුගිය වසරේ දී, එතෙර රැකියාවල යෙදෙන ශ්‍රී ලාංකිකයන් එවූ මුදල් වෙලඳ හිඟය පියවා ගැනීමට උදව්කාරක විය. එහෙත් මේ වසරේ එසේ ලැබෙන මුදල් එම හිඟය පියවීමට ප්‍රමානවත් නොවනු ඇතැයි *ටයිම්ස්* තර්ක කලේය. "ආධාර, ආයෝජන කලඹ හා සෘජු විදේශ ආයෝජන ආකාරයෙන් ප්‍රාග්ධනය රටට ගලා ඒම හිඟය පියවීමට තරම් විශාල " නොවුන හොත් "ගෙවුම් ශේෂ අර්බුදයක් " හටගනු ඇත. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමග පවතින එකඟතාවයේ මොන යම් හෝ බිඳීමක ප්‍රතිඵලය ලෙස රටෙන් විදේශ ආයෝජකයන් ක්ෂනිකව පලායාමක් සිදු වනු ඇත.

විරුද්ධ පක්ෂ ආන්ඩුවේ සැලසුම් පිටුපස දැනටමත් පෙල ගැසී ඇත. එක්සත් ජාතික පක්ෂයේ (එජාප) ආර්ථික ප්‍රකාශක හර්ෂ ද සිල්වා මැයි 21 දා මූල්‍ය අරමුදලේ නියෝජිත කන්ඩායම මුනගැසුනේය. මූල්‍ය අරමුදල තෙවන නය වාරිකය නිදහස් කරනු ඇත්තේ "එය අයවැය ගනන් හිලව් පිලිබඳව සතුටු වුව හොත් පමනක් " යයි ඔහු ඩේලි මිරර් පත්‍රයට පැවසීය. මහජනතාව අඳුරේ තබන්නේ යයි ආන්ඩුව විවේචනය කරන අතරම, ද සිල්වා පැවසුවේ "මුල පටන්ම" ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් නය ඉල්ලුම් කරන ලෙස එජාපය ආන්ඩුවෙන් ඉල්ලා සිටි බවයි.

නේෂන් පත්‍රය සමග පැවති සම්මුඛ සාකච්ඡාවක දී ද සිල්වා මෙසේ ද පැවසීයඃ "අප කියන්නේ හිඟයන් අඩු කල යුතු බවයි. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල ද එය කියා සිටින්නේ නම් වඩාත් හොඳයි. . . . ආන්ඩුවට ද මූල්‍ය අරමුදලේ නය ලබාගැනීමට අවශ්‍යයි. ඔවුන් එය ලබාගැනීමට බොහෝ සෙයින් වෙහෙසෙනවා. එයින් අදහස් වන්නේ අපි දෙගොල්ලම ඒ සම්බන්ධයෙන් සිටින්නේ එකම අදහසක බවයි." පාලක පන්තියේ මෙම ඒකමතික භාවයට යටින් පවතින කාරනාව නම් කම්කරු පන්තිය අර්බුදයේ බරට කර ගැසිය යුතු ය යන එකඟතාවයි.

© www.wsws.org